**මීගමුව අධ්‍යාපන කලාපය**

**දෙවන වාර ඇගයීම-2025**

**පුරවැසි අධ්‍යාපනය**

**විභාග අංකය / නම :** ..........................................................................................................................................

| | | |
|---|---|---|
| 9 ශ්‍රේණිය | | කාලය පැය 02 |

## I කොටස

★ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

★ **අංක 01 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ''ඔබ කුමක් කළත් හොඳ කෙනෙක් වන්න'' යන ප්‍රසිද්ධ කියමන ප්‍රකාශ කරනු ලැබුවේ.

(i) ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල් ය. (ii) ජෝන් එෆ් කෙනඩි ය.

(iii) ඒබ්‍රහම් ලින්කන් ය. (iv) තෝමස් අල්වා එඩිසන් ය.

(2) මංකොල්ල කෑම, ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන යන වැරදි සම්බන්ධයෙන් බලපානු ලබන නීතිය වනුයේ,

(i) අන්තර්ජාතික නීතිය යි.

(ii) අපරාධ නීතිය යි.

(iii) සිවිල් නීතිය යි.

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යි.

(3) යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් ඇතිවන ප්‍රතිලාභක් නොවන්නේ,

(i) මිනිසා යාන්ත්‍රීකරණය වීම.

(ii) සම්පත් භාවිතය කාර්යක්ෂම වීම.

(iii) සම්පත්වල ඵලදායිතාව ඉහළ යාම.

(iv) පරිසර තුල්‍යතාව රැකගත හැකිවීම.

(4) ''රට වට බැඳි රන් වැට'' යන්න.

(i) ශ්‍රී ලංකා පොලිසියේ ආදර්ශ පාඨය යි.

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදර්ශ පාඨය යි.

(iii) ශ්‍රී ලංකා යුධ හමුදවේ ආදර්ශ පාඨය යි.

(iv) ශ්‍රී ලංකාවේ නාවික හමුදාවේ ආදර්ශ පාඨය යි.

(5) සමුපාකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකෙන්නනේ,

(ii) රොබට් ඕවන් මහතා ය.

(iii) ඊ.බී. ටයිලර් මහතා ය.

(iv) රොබට් නොක්ස් මහතා ය.

(iv) ඒබ්‍රහම් ලින්කන් මහතා ය.

★ **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(6) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ .............................. තුමාය.

(7) හිස නමා ආචාර කිරීම, කිමෝනාව ඇඳීම, සුමෝ ක්‍රීඩාව ............................... රටෙහි සංස්කෘතිකාංග වේ.

(8) ජාතිය ගොඩනැගීම සඳහා ................................. ජාතික ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කිරීම ඉතා වැදගත්ය.

(9) කල් පවතින හෙවත් දරාගත හැකි සංවර්ධනය ..................................... සංවර්ධනය යි.

(10) ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණ ආයතනය වන්නේ ...................................... යි.

(අභියාචනාධිකරණ / නීතිපති / තිරසාර / එළදායී / ජපන් / අප්‍රිකානු / ශ්‍රේෂ්ඨාධිකරණය)

★ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(11) තම කටයුතු වඩා පහසුකර ගැනීම සඳහා මිනිසා යොදා ගන්නා ක්‍රමවේදය තාක්ෂණය ලෙස හඳුන්වයි. (...........)

(12) ජනතාව කෙළින්ම පාලන කටයුතු වලට සම්බන්ධ වීම නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යි. (...........)

(13) එක්සත් රාජධානිය ද්වී පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රටකි. (...........)

(14) නමක් හා ජාතියක් ලැබීමට ඇති අයිතිය පුරවැසියෙකු සතු අයිතිවාසිකමකි. (...........)

(15) දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම මැතිවරණ සම්බන්ධ පුරවැසි අයිතවාසිකමක් නොවේ. (............)

❖ **අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| (16) සිරිත් විරිත් | (A) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණයකි. |
| (17) නීති ගරුක බව | (B) රථ වාහන හැසිරවීම. |
| (18) නිදහස් ජනමාධ්‍ය | (C) සමාජයේ පවතින සියලුම රැකියා අවස්ථා. |
| (19) පොලීසියේ කාර්යයකි | (D) නීතියේ මූලාශ්‍රයකි |
| (20) වැඩ ලෝකය ලෙස හැඳින්වේ | (E) යහජීවන ගුණාංගයකි |
| | (F) මහ සයුරේ ආරක්ෂාව සැපයීම |

(ල. 2 x 20 = 40)

## II කොටස

★ **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

★ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

---

(1) (i) සමාජ සුරක්ෂිතතාව ඇති කරන සමාජ ආයතන දෙකක් නම් කරන්න.

(ii) නීතියේ ගුණාංග දෙකක් ලියන්න.

(iii) ආරවුලක් සමථ මණ්ඩලය වෙත යොමු කළ හැකි ක්‍රම දෙකක් ලියන්න.

(iv) නිෂ්පාදන විවිධාංගීකරණය යටතේ තේ නිෂ්පාදනය විවිධාංගීකරණය වී ඇති ආකාර දෙකක් ලියන්න.

(v) වත්මන් රැකියා වෙළඳපොල ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ. එම අංශ දෙක ලියන්න.

(vi) සහජීවන ගුණාංග දෙකක් ලියන්න.

(vii) ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙක ලියන්න.

(viii) ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකක් ලියන්න.

(ල. 2 x 8 = 16)

(2) (i) සමාජ සුරක්ෂිතතාව සඳහා පවුලකින් ඉටුවිය යුතු කාර්යයන් දෙකක් ලියන්න. (ල. 2)

(ii) නීතියේ මූලාශ්‍ර හතරක් ලියන්න. (ල. 4)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතියට අයත් අධිකරණ පහක් ලියන්න. (ල. 5)

(3) (i) තාක්ෂණික වෙනස්වීම නිසා ඇතිවන හිතකර බලපෑම් දෙකක් සඳහන් කරන්න. (ල. 2)

(ii) වර්තමානයේ තාක්ෂණය යොදා ගැනෙන අවස්ථා හතරක් ලියන්න. (ල. 4)

(iii) තාක්ෂණය වෙනස්වීමත් සමඟ කෘෂිකාර්මික අංශය තුළ සිදු වී ඇති වෙනස්කම් පහක් ලියන්න. (ල. 5)

(4) (i) ඕනෑම රටක ආර්ථිකයේ සිදුවන ප්‍රධාන ක්‍රියාවලීන් තුනක් හඳුනාගත හැක. ඉන් දෙකක් ලියන්න. (ල. 2)

(ii) ආර්ථිකයක සේවා අංශයට අයත් ක්ෂේත්‍ර හතරක් ලියන්න. (ල. 4)

(iii) යහජීවන ගුණාංග පුහුණු නොකිරීමෙන් ඇතිවිය හැකි අයහපත් ප්‍රතිවිපාක පහක් ලියන්න. (ල. 5)

(5) (i) සමුපාකාර ව්‍යාපාරයේ ආදර්ශ පාඨය ලියන්න. (ල. 2)

(ii) ලංකාවේ ක්‍රියාත්මක වන සමුපාකාර සමිති වර්ග හතරක් ලියන්න. (ල. 4)

(iii) විවිධ සේවා සමුපාකාර මගින් ඉටුවන සේවාවන් පහක් ලියන්න. (ල. 5)

(6) (i) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(ii) වර්තමානයේ සෘජු ප්‍රජාතන්තතතතතත්‍රවාදය ක්‍රියාත්මත කිරීමේදී මතුවන ගැටලු හතරක් ලියන්න. (ල. 4)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ පහක් ලියන්න. (ල. 5)

(7) (i) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ දෙකක් ලියන්න. (ල. 2)

(ii) අයිතිවාසිකම් භුක්ති විඳීමේදී පුරවැසියෙකු වශයෙන් අනෙක් සමාජයට ඉටුවිය යුතු යුතුකම් හතරක් ලියන්න. (ල. 4)

(iii) ස්ථිරසාර භාවය ගොඩනගා ගැනීම සඳහා පුද්ලයකු තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග පහක් ලියන්න. (ල. 5)